WWW.ASKNETWORK.NET

Sinhala

දෙවියන්වහන්සේගේ වචනය මෙනෙහි කිරීම

බලවත් සම්බන්ධයන් සහ යෙදුම් සමඟ භක්තිමත් පිළිවෙතක්

මාගේ පර්වතය ද මාගේ මිදුම්කරු ද වන සමිඳුනි, මා මුවේ වචන ද මා සිතෙහි භාවනා ද ඔබ හට ප්‍රිය මනාප වේවා! ගීතාවලිය 19:14

ASK NETWORK දෙවියන්වහන්සේගේ වචනය මත පදනම් වූවකි. දෙවියන්වහන්සේගේ ..... විiAතර කරමින් එපීස 6වන පරිච්ඡේදය මෙම පද වලින් අවසනවේ: ගැළවීම නමැති හිස්වැස්මද ශුද්ධාත්මයාණන්වහන්සේගෙන් වන දේවවචනය නමැති කඩුවද ගන්න. සෑමවිටම, මුළු සිතින් යාච්ඤාවේ ද අයැදීමේ ද යෙදී සිටින්න. ආත්මයාණන් වහන්සේගේ බලයෙන් යාච්ඤා කරන්න. මේ කරුණා නිසා නිතර අවදිව නොකඩව දෙවියන්වහන්සේගේ සියලු සෙනඟ උදෙසා, යාච්ඤා කරන්න. (එපීස 6:17-18) ගැළවීම නමැති හිස්වැස්ම විස්තර කරන්නේ කිතුණුවන් ක්‍රිස්තුස්වහවන්සේගේ මනස ඇතිව සිටීමයි. දේවවචනය නමැති කඩුව.

යනු දේව වචනයේ සම්පූර්ණ උපදේශයයි. ආත්මයාණන්වහන්සේගේබලයෙන්යාච්ඤා කිරීම යනු අපගේ මැදිහත් වීම තුළ දැනුවත්වී, බලගැන්වී සහ බලවත් වී යන්නය. ASK Network හි, යේසුස් ක්‍රිස්තුස්වහන්සේගේ ඇදහිලිවතුන් ලෙස අපි ශුද්ධාත්මයාණන් මත රඳා සිටිමින්, වචනය වෙත යොමු වෙමින් උන්වහන්සේ කෙරෙහි බලා සිටින විට, උන්වහන්සේගේ මනස අපට ඇති බව අපි විශ්වාස කරමු.

මෙම පොත් පිංච දෙවියන්වහන්සේගේ වචනය මත භාවනා කිරීම යන පුද්ගලික භක්තිමත් පිළිවෙත සඳහා උපදෙසක් ලෙස පිළියෙල කර ඇත. ඔබගේ මෙනෙහි කිරීම වඩාත් අර්ථවත් කරගැනීම සහ ඉල්ලා සිටීමේදී ඔබගේ භාවනා කිරීම අදාල කරගැනීම සඳහා ප්‍රායෝගික යෝජනා ඇතුලත් වේ.

බයිබලීය මෙනෙහි කිරීමේ භක්තිමත් පිළිවෙත

යම් කෙනෙක් තමන්ගේ ආත්මික ජීවිතයේ පුද්ගලික විනයක් ලෙස වචනය මත භාවනා කිරීම වර්ධනය කරගන්නේ නම්, ඔවුන්ට දේව වචනය තුළින් දෙවියන්වහන්සේගේ හඬ ඇසීමට පුරුදු වන්නේය. ඩන්කන් කැම්බල් ඉගැන්වූයේ වචනය කියවීම යහපත් බව, නමුත් අප බයිබලය මත භාවනා කරන්නට කාලය ගත කරන විට සිදුවනවා සේ වචනය අප තුළින් යාම ඊටත් වඩා වැදගත් බවත්ය. මෙය විස්තර කර ඇත්තේ ආත්මයේ ආහාර දිරවීමේ පීඨය ලෙසයි; වචනය අපගේ කොටසක් විය හැකි ආකාරය අපට තේරුම්ගන්නට උපකාරී වෙයි. මෙය තේරුම්ගැනීමට එක් මාර්ගයක් වන්නේ ඔබේ අත ගැන සිතන්න. ඔබේ ඇඟිලි අප දේව වචනයේන ඉගෙනගන්නා ආකාර නියෝජනය කරනවා යයි සිතන්න: බයිබල් අධ්‍යයනය, ඉගැන්වීම, කටපාඩම් කිරීම සහ ගායනය කිරීම. ඔබට ඇඟිලි හතරකින් බයිබලයක් හොඳින් සමබරව අල්ලාගත හැකියි. කෙසේවෙතත් එය තදින් අල්ලාගන්නට ඔබේ මහපොට ඇඟිල්ල අවශ්‍ය වනවා. බයිබලය මත භාවනා කිරීමෙන් ලැබෙන අවබෝධයේ ගැඹුර එය නියෝජනය කළ හැකියි.

ඔබට බයිබලය මහපොට ඇඟිල්ලෙන් පමණක් අල්ලා ගන්නට නොහැකියි, එහෙත් මහපොට ඇඟිල්ල සහ අනෙක් ඇඟිලි සමඟ ඔබට දේව වචනය පහසුවෙන් ඔබෙන් ඉවතට ගැනීමට නොහැකි වන ලෙස තදින් අල්ලා ගත හැකි වනු ඇත.

බයිබලය මෙනෙහි කිරීම පිළිබඳ එක් අර්ථ දැක්වීමක් වන්නේ "ශුද්ධ ලියවිල්ල ගැන කල්පනා කිරීම, සළකා බැලීම සහ මෙනෙහි කිරීමය."

ජිම් පැකර් මෙසේ පවසයි: භාවනා කිරීම යනු දෙවියන්වහන්සේගේ ක්‍රියාවන්, මාර්ග, අරමුණු සහ පොරොන්දු පිළිබඳ තමන් දන්නා දේ සිහිගන්වමින්, ඒවා ගැන සිතමින්, නැවත සිතා බලා තමන්ටම අදාල කරගැනීමයි. එය දෙවියන්වහන්සේ ඉදිරියෙහි, දෙවියන්වහන්සේගේ ඇස යට, දෙවියන්වහන්සේගේ උපකාරයෙන්, දෙවියන්වහන්සේ සමඟ සහයෝගීතාවයේ මාධ්‍යයක් ලෙස සවිඥානිකව සිදු කරනු ලබන ශුද්ධ සිතුවිලිවල ක්‍රියාකාරකමකි. එහි අරමුණ වන්නේ දෙවියන්වහන්සේ පිළිබඳ තමන්ගේ මානසික සහ ආත්මික දැක්ම පැහැදිලි කරගෙන තමන්ගේ මනස සහ හදවත මත උන්වහන්සේගේ සත්‍යය සම්පූර්ණ සහ නිවැරදි බලපෑමක් ඇති කිරීමය.

ඒ. ඩබ්. ටෝසර් බයිබලීය භාවනාවේ භක්තිමත් පුරුද්ද විස්තර කරන්නේ මෙසේය: අපි දෙවියන්වහන්සේ කෙරෙහි බලා සිටීම වැදගත්. ඒ වගේම හොඳම දේ තමයි දෙවියන්වහන්සේ සමඟ තනිව සිටීම, වඩාත් සුදුසු වන්නේ අපගේ බයිබලය අප ඉදිරියේ දිගහැරගෙන සිටීමයි. එවිට අපි කැමති නම්, අපට දෙවියන්වහන්සේ වෙත ළඟා විය හැකි අතර, උන්වහන්සේ අපගේ හදවත් තුළ අපට කතා කරන ආකාරය ඇසීමට පටන් ගනිමු. සාමාන්‍ය කෙනෙකුගේ ප්‍රගතිය මෙසේ විය හැකි යයි මා සිතමි: පළමුව ශබ්දයක්, කෙනෙක් වත්තක ඇවිදිනවා සේ. පසුව හඬක්, වඩාත් තේරුම් ගත හැකි අයුරින්, නමුත් තවමත් අපැහැදිලියි. ඊටපසුව ආත්මය දේව වචනය වඩාත් පැහැදිලි කිරීමේ ප්‍රීතිමත් මොහොතක්. මෙතෙක් ශබ්දයක්, හෝ හඬක් දැන් තේරුම් ගත හැකි වචනයක්, උණුසුම් සහ සමීප සහ ප්‍රේමණීය මිතුරෙකුගෙන් වචනයක් මෙනි. ඉන්පසුව එන්නේ ජීවනය සහ ආලෝකය, සහ ඊටත් වඩා හොඳ, යේසුස් ක්‍රිස්තුස්වහන්සේ සියල්ලන්ගේ ගැළවුම්කරු සහ ස්වාමින් දකින්නට සහ වැළඳගන්නට හැකි වනු ඇත.

බයිබලීය මෙනෙහි කිරීම පුරුද්දක් ලෙස කරන අය ස්වාමින්වහන්සේ සමඟ ගැඹුරු සහ සැනසීම ගෙනෙන අත්දැකීම් ලැබෙන බවට පැහැදිලි වේ. ASK Network හි අපගේ ආශාව වන්නේ,ඉල්ලා සිටීමට සූදානම් වීමක් වශයෙන් සහ එම ඉල්ලා සිටීම ශුද්ධාත්මයාණන් විසින් මඟපෙන්වනු ලබන්නට යන දෙයාකාරයෙන්ම ස්වාමින්වහන්සේට කිට්ටු වන්න, උන්වහන්සේගේ වචනය සහ ශුද්ධාත්මයන් තුළින් උන්වහන්සේගේ හඬ අසන්නයි.

කෙනෙක් දේව වචනය මෙනෙහි කරන විට, තමන් ගැන අමතක කරමින්, ඔවුන්ගේ මනස දෙවියන්වහන්සේ, උන්වහන්සේගේ චරිතය සහ උන්වහන්සේගේ මාර්ග පිළිබඳ ගැඹුරු සිතුවිලි වලින් පිරී තිබෙයි. මෙය කෙනෙකුගේ මනසෙහි සිතුවිලි හිස් කිරීමට දිරිගන්වන නමුත් අනිවාර්යයෙන්ම ස්වයං-නැඹුරු වූ ලෝකෝත්තර භාවනාවට වඩා බෙහෙවින් වෙනස් ය.

මෙනෙහි කිරීම පිළිබඳ බයිබල් පද

ශුද්ධ ලියවිල්ලේ (NIV) මෙනෙහි කරන්න හෝ මෙනෙහි කිරීම යන වචන සඳහා පැහැදිලි භාවිතයන් 21 ක් පමණක් ඇත. මෙන්න ප්‍රධාන ඒවා කිහිපයක්:

- මේ නීති සං. හය නුඹ නිතරම කියවිය යුතුය. එහි ලියාතිබෙන සියල්ල අනුව යාකරන පිණිස ඒ ගැන දිවා රෑ දෙක් හි භාවනා කළ යුතුය. එවිට නුඹ කරන දේ සඵල වී නුඹට ශුභ සිද්ධිය සැලසෙනු ඇත. යොෂුවා 1:8

- දු දනන් උපදෙස් අනුව නොයන, පව්කරුවන්ගේ මඟ නොයන, දෙවිඳුන් ගරහන්නන් ඇසුරු නොකරන, සමිඳුන්ගේ විනයෙහි Sති මුදිත වන, දිවා රෑ එය භාවනා කරන මිනිසා භා. වන්තයෙක්වන්නේය. ගීතාවලිය 1:1-2

- § දෙවිඳුනි, ඔබ මැදුරෙහි ඔබේ තිර පෙම් කඳ අපි සිහි කෙළෙමු. ගීතාවලිය 48:9

- § මම නැණවත් සිතුවිලි සිතමි; මම පැණවත් වදන් පවසමි. ගීතාවලිය 49:3

- මාගේ භාවනාව සමිඳුන්ට සන්න වේවා! මන්ද, මගේ m%Sතිය එන්නේ එතුමන්ගෙන්ය. ගීතාවලිය 104:34

- ඔබේ jHවස්ථාවට මම කොපමණ ම කරමිද? එය මාගේ දෛනික භාවනාව වේ. ඔබේ ආඥා නිතරම මා සමඟය. එයින් මාගේ සතුරන්ට වඩා මම පැණවත් වෙමි. මාගේ සියලු ඇදුරන්ට වඩා මට නැණ නුවණ ඇත්තේය. මාගේ භාවනාව ඔබේ ශික්ෂා ගැනමය. ගීතාවලිය 119:97-99

කෙසේ වෙතත්, ස්වාමින්වහන්සේ කෙරෙහි බලා සිටීම, උන්වහන්සේව සෙවීම, උන්වහන්සේගේ අභිමුඛයේ රැඳී සිටීම, උන්වහන්සේ සමඟ සමීපව සන්නිවේදනය කිරීම, උන්වහන්සේ සහ උන්වහන්සේගේ වචන සලකා බැලීම, රැස්වීම, සෙවීම, මංගල්‍ය පැවැත්වීම යනාදී සංකල්ප ශුද්ධ ලියවිල්ල පුරා ගෙතී ඇත. මේ සඳහා උදාහරණ හෝ රූප කිහිපයක් මෙන්න:

- අවශ්‍යතාව අනුව දිනපතා මන්නා රැස්කිරීම. නික්මයාම 16·වනයේ ගස් අතරේ ජම්බු ගස් යම් සේද තරුණයන් අතරේ මාගේ පෙම්වතාත් එසේමය. ඒ රුක්සෙවණෙහි හිඳීමට මම ය කරමි; එහි ඵල මා මුවට ඉමිහිරිය. ඔහු බොදුන්හලට මා ගෙනායේය. මට උඩින් එසෙවු කොඩිය මයය. ප්‍රේම ගී 2:3-4

- උන්වහන්සේ කතාකරමින්, “මනුෂ්‍ය පුත්‍රය, නුඹට දෙනලද දේ අනුභව කරන්න. මේ පොත අනුභව කරගොස් යෙල් වංශයට කතා කරන්නැ”යි වදාළසේක. එවිට මම මාගේ කට ඇරියෙමි; උන්වහන්සේද ඒ පොත අනුභව කරන්න මට දුන්සේක. තවද, උන්වහන්සේ කතා කරමින්, “මනුෂ්‍යපුත්‍රය, මා නුඹට දෙන මේ පොත අනුභව කර නුඹේ කුස පුරවාගන්නැ”යි මට වදාළසේක. මම එය අනුභව කෙළෙමි; එය මාගේ කටට මී පැණි මෙන් මිහිරිව තිබිණි. එසකියෙල් 3:1-3

- ගෝලයින් එම්මාවුස් වෙත ගමන් කිරීම: තවද උන්වහන්සේ ඔවුන් හා සමඟ කෑමට හිඳගත් කල්හි, රොටි ගෙන ආශීර්වාදය පවසා, කඩා ඔවුන්ට දුන් සේක. එවිට ඔවුන්ගේ ඇස් ඇරී, ඔව්හු උන්වහන්සේ කවරෙක් දැයි හැඳින ගත්හ. එවිට උන්වහන්සේ ඔවුන් කෙරෙන් අතුරුදහන් වූ සේක. එකල ඔව්හු, “උන්වහන්සේ අප හා සමඟ මඟ දී කතා කරද්දීත්, ශුද්ධ ලියවිල්ල පහදා දෙද්දීත්, අපේ හදවත දැවී ඇවිළී ගියා නොවේ දැ”යි එකිනෙකාට කී හ. ලූක් 24:30-32

- මෙන්න, මම දොර ළඟ සිට තට්ටු කරමි. යමෙක් මාගේ හඬ අසා දොර අරින්නේ නම් මම ඇතුළු වී, ඔහු සමඟ කෑම කන්නෙමි. ඔහු ද මා සමඟ කෑම කන්නේ ය. එළිදරව් 3:20

මීට වඩා බොහෝ උදාහරණ තිබේ. ඔබ බයිබලය කියවන විට ඔබට ඒවා සෙවීමෙන් සතුටක් ලැබිය හැකිය.
දෙවියන්වහන්සේගේ වචනය මෙනෙහි කිරීම සම්පූර්ණයෙන්ම බයිබලානුකූල බව ඔබට නිසැකවම පෙනී යනු ඇත!

දෙවියන්වහන්සේගේ වචනය මෙනෙහි කරන්නේ කෙසේද

මෙහි අරමුණ වන්නේ දෙවියන්වහන්සේගේ වචනයෙන් ලබා ගැනීම සඳහා අනුගමනය කළ හැකි පියවර කිහිපයක් ඉදිරිපත් කිරීමයි. මෙම මාර්ගෝපදේශ කිසිසේත්ම නියම කර ඇති ඒවා නොවේ, නීතිමය වශයෙන් අනුගමනය කිරීම අවශ්‍ය නොවේ; නමුත් ස්වාමින්වහන්සේ මඟ පෙන්වන පරිදි ඒවා අනුගමනය කරන්න, එවිට ඔබ වචනය තුළ මෙනෙහි කරන කාලය වඩ වඩාත් අනගි හා ඵලදායි වනු ඇත. ඔබේ මෙනෙහි කිරීමේ කාලය පෞද්ගලික නම් සහ නිතිපතා ආත්මික අභ්‍යාසයක කොටසක් නම්, බොහෝ විට ඔබ න්‍යාය පත්‍රයක් සමඟ වචනය වෙත නොපැමිණෙනු ඇත, ඒ වෙනුවට ඔබ ස්වාමින්වහන්සේ තමාට අවශ්‍ය පරිදි කථා කරනු ඇතැයි අපේක්ෂාවෙන් වචනය වෙත පැමිණෙනු ඇත. නිශ්චිත විෂයක් ගැන යාච්ඤා කිරීම සඳහා ඔබ වචනය වෙත පැමිණෙන විට ඇති එකම සුළු වෙනස නම්, මෙම යාච්ඤා විෂයට අදාළ කිරීම සඳහා සත්‍යයන් අඩංගු ශුද්ධ ලියවිලි පාඨයක් තෝරා ගැනීමට ඔබට උපකාර කිරීමට ශුද්ධාත්මයාණන් වහන්සේ විශ්වාස කිරීමයි. නිදසුනක් වශයෙන්, එපීසවරුන්ට ලියූ ලිපිය ක්‍රිස්තුස් වහන්සේගේ මනාලිය පිළිබඳ ශුද්ධ ලියවිලිවල ඉතා බලවත් කොටසක් වන අතර, එම පරිච්ඡේදවල මෙනෙහි කිරීමෙන් සභාව සඳහා යාච්ඤා කිරීමේදී අදාළ කර ගත හැකි සියලු ආකාරයේ අපූරු සත්‍යයන් හෙළි වනු ඇතැයි කෙනෙකුට අපේක්ෂා කළ හැකිය. ඇත්ත වශයෙන්ම යේසුස්වහන්සේ සභාවටම වචනය අදාළ කර ගත් බව විස්තර කර ඇත: උන්වහන්සේ එසේ කෙළේ, වචනය නමැති වතුරෙන් ද සභාව සෝදා පිරිසුදු කර, කැප කර, එය තේජාන්විත සභාවක් වශයෙන් කැළලක් වත්, රැල්ලක් වත්, එබඳු කිසිවක් වත් නැති ව විශුද්ධ ව, නිකෙලෙස් ව, තමන්ට ම ප්‍රදානය කරගැනීමට ය. (එපීස 5:26-27) එමනිසා, අපි මෙනෙහි කරන විට, අපගේ මනසෙහි නිරන්තරයෙන් යාච්ඤාව සඳහා විෂය හෝ අවධානය තබා ගනු ඇත, පළමුව අපගේ භාවනාව තුළින් වචනය ඒ සඳහා අදාළ කර ගන්නා අතර, පසුව අපගේ ඉල්ලා සිටීම තුළ.

යෝජිත මාර්ගෝපදේශ:

- නිශ්ෂබ්දතාවය සොයන්න. ප්‍රායෝගික වශයෙන් නිශ්ෂබ්ද ස්ථානයක සිටීම උපකාරයක් වන අතර අපගේ මනසින් අවධානය බිඳිය හැකි යම් දේ ඉවත් කරන ලෙසට ස්වාමින්වහන්සේගෙන් ඉල්ලා සිටිය යුතුයි.ලෝකයෙන්, මාංසයෙන් හෝ යක්ෂයාගෙන් ආ හැකි ඕනෑම ආක්‍රමණශීලී සිතුවිලි ඉවත් කර, ශුද්ධාත්මයාණන්ගෙන් ශුද්ධ සිතුවිලි ලබා ගැනීමට ඔබේ මනස කැප කරන්න.
- නමස්කාරයෙන් ආරම්භ කරන්න. මෙය දෙවියන්වහන්සේ කවුද යන්න පිළිගැනීම (පහල ඇති දෙවියන්වහන්සේගේ නාමයන් බලන්න) හෝ අන් අය සමඟ එකට ගායනා කිරීම තරම් සරල විය හැකිය. ඔබ හොඳින් දන්නා ගීතිකා ගායනා කිරීම එයට ඇතුලත් විය හැකියි, නමුත් ශුද්ධාත්මයාණන්ගේ මඟපෙන්වීම අනුව ඔබට දේව වචනයෙන් කොටස් හෝ ගීතාවලියෙන් කොටස් ගෙන ඒවා නිදහසේ ගායනා කළ හැකිය. මහත් දේ කරන ලෙසට අප ඉල්ලන්ට සූදානම් වන මේ දෙවියන්වහන්සේ කවුද යන්න ප්‍රකාශ කිරීමේ බලයක් ඇත. එමෙන්ම එය ඉල්ලා සිටීම පිණිස අපගේ හදවත් සූදානම් කරන අතර අපගේ ඇදහිල්ල ශක්තිමත් කරයි..
- ඉල්ලා සිටීමට යොමු වෙන්න. ඔබට යාච්ඤාව සඳහා මාතෘකාවක් සිතේ නැත්නම්, ඔබ තනිවම හෝ අන් අය සමඟ යාච්ඤා කරන්නේ නම්, ඔබ ඉල්ලා සිටිය යුතු දේ සම්බන්ධයෙන් ස්වාමින්වහන්සේට පෙන්වන ලෙසට උවමනාවෙන් අසා සිටින්න. ඔබ මෙනෙහි කරන විට ඔබ ඒ ගැන මනසින් යොමු වී සිටිමින් වචනයේ සත්‍යය එයට අදාල කරගත හැකි වනු ඇත.
- දේව වචනයේ කොටස. වචනයේ කොටසක් තෝරාගන්න, එය එක් පදයක් වැනි කෙටි කොටසක් විය හැකි අතර පරිච්ඡේදයකට වඩා දිග නොවිය යුතුයි. එහි සන්දර්භය දෙස බලන්න, මන්ද ඔබගේ තේරුම්ගැනීමට එය උපකාර වන්නේය. එය සෙමින් කියවන්න, අවශ්‍ය නම් නැවත නැවත කියවන්න. ස්වාමින්වහන්සේ ඔබට පෙන්වීමට කැමතිදේ, උන්වහන්සේ ඔබට ලබාගැනීමට කැමති අවබෝධය ඉස්මතු කිරීමට පටන්ගන්නාලෙස ශුද්ධාත්මයාණන්ගෙන් ඉල්ලා සිටින්න. එක් වචනයක් ඔබේ අවධානයට ලක්වනවා ඔබට දැනිය හැකිය, එසේ නැතිනම් එක් අදහසක් හෝ විශේෂ පදයක්, ක්‍රියා පදයන් හෝ කෙනෙකුගේ නමක් යනාදිය විය හැකිය. ඒ එක් දෙය පිළිබඳ නැවතී කල්පනා කරන්න.ඒ ගැන නිර්මාණශීලී ලෙස සිතෙන්නට ඉඩ හරින්න. එයට සම්බන්ධ වෙනත් පද ඔබේ සිතට ආ හැකිය. ඔබ මෙනෙහි කරන විට ඔබට විවිධ අලංකාර සිතුවිලි, අවබෝධයන් සහ හෙළිදරව් මනසට එන්නට පටන් ගනියි. ස්වාමින්වහන්සේ කතා කරන බව ඔබ විශ්වාස කළ යුතු අතර, එය ඔබ යාච්ඤාව සඳහා තබා ඇති අවධානයට අදාළ වන්නේ මන්දැයි ඔබට පෙනෙනු ඇත.

  මෙහි ඇති පුදුමය එය අත්විඳ නැති කෙනෙකුට පැහැදිලි කිරීම දුෂ්කරය, නමුත් සැබවින්ම ඔබ දෙවියන්වහන්සේගේ වචනයෙන් ඔබ කවදාවත් දැක නැති දේවල්, ඔබට අතිශයින් හුරුපුරුදු ඡේදවල පවා, දකිනු ඇත.
- ඔබගේ මෙනෙහි කිරීම සටහන් කරගන්න. ඔබට හැකි නම් ඔබට එන සෑම සිතුවිල්ලක්ම ලියා ගැනීම උපකාරී වනු ඇත. මෙහි ප්‍රතිලාභ බොහොමයක් ඇත: ඔබගේ සිතුවිලි පිළිවෙලකට හසුරුවාගන්න උපකාරී වෙයි, ඔබට ලැබී ඇති සියල්ල පිළිබඳ යාච්ඤා කරන්නට උපකාරී වෙයි. එමෙන්ම දෙවියන්වහන්සේ ඔබගේ යාච්ඤා වලට පිළිතුරු පිළිබඳ සටහනක් ඔබට ලැබෙයි.
- ඔබගේ මෙනෙහි කිරීම තේරුම් ගැනීම. ඔබගේ මෙනෙහි කිරීම සම්පූර්ණ වූවා යයි දැනී යාච්ඤා කිරීමට නිශ්චිත දේවල් කීපයක් ඔබට ලැබුණු විට ඔබට යාච්ඤා කරන්නට පටන් ගත හැකිය. ඔබ අන් අය සමඟ යාච්ඤා කරන්නේ නම්, සියළු දෙනාම ඔබට ලැබුණු අවබෝධය කෙටියෙන් බෙදා ගත යුතුය. සියළු දෙනාගේම මෙනෙහි කිරීම් එකට සම්බන්ධ වී වඩාත් සම්පූර්ණ දසුනක් ඔබට ලැබුණු ආකාරය ඔබව පුදුමයට පත්කරනවා ඇත.
- මෙනෙහි කිරීම ක්‍රියාවට නැංවීම. මෙනෙහි කිරීම තුළින් ඔබට ලැබෙන සත්‍යයන් පළමුවෙන්ම ඔබට පුද්ගලිකව අදාල වනවා ඇත. ඔබට එම අවබෝධය ලැබුණු පසු, ඔබ ඉල්ලා සිටින කුමන හෝ දෙයකට අදාල කරගැනීමට ඔබ සූදානම් ය. ඔබ යාච්ඤා කළ යුත්තේ කෙසේද යන්න උපයාමාර්ගයක් ලබාගන්නා සේය. ඔබට ලැබී ඇති දේ, දෙවියන්වහන්සේ විසින් ඔබට පෙන්වා දී ඇති බව අධිකාරියෙන් යුක්තව යාච්ඤා කරන්න. මේ දේවල් දෙවියන්වහන්සේ විසින් ඔබට පෙන්වා දී ඇති බවත්, උන්වහන්සේ ඔබේ ප්‍රශ්නවලට පිළිතුරු දීමට කැමති බවත් විශ්වාසයෙන් සිටින්න.
- ස්තුති දීම. ඔබගේ මෙනෙහි කිරීමේ සහ යාච්ඤා කාලය, නැවුම් පාන් මෙන් ඔබට උන්වහන්සේගේ වචනයෙන් අළුත් දේ දකින්නට ඉඩ දීම පිළිබඳ දෙවියන්වහන්සේට ස්තුති කරමින් අවසන් කරන්න. එමෙන්ම උන්වහන්සේගේ කරුණාවන්ත විශ්වාසවන්තකම තුළින් ඔබගේ ඉල්ලීම් වලට පිළිතුරු දෙන නිසාද උන්වහන්සේට ස්තුති කරන්න.

බයිබලීය මෙනෙහි කිරීමේ ප්‍රතිලාභ

දෙවියන්වහන්සේගේ වචනය මෙනෙහි කිරීමේ ප්‍රතිලාභ බොහෝමයක් ඇත. ආශිර්වාද කොපමණ සංඛ්‍යාවක් තිබෙනවාද යන්න අදහසක් ගත හැකි එක් ආකාරයක් නම් ඒවායින් බොහොමයක් සඳහන් කර ඇති ගීතාවලිය 119 කියවීමෙනි. ජාකොබ් 1:21මෙසේ කියා ඇත: ...ඔබට ගැළවීම සාදු දියහැකි, ඔබ සිත් සතන්හි මුල් බැසගත් දහම් පණිවුඩය යටහත් ලෙස පිළිගන්න. මෙය විස්මය දනවන සත්‍යයකි. වචනය අප කවුරුන්ද යන්නෙහි කොටසක් බවට පත් වී, අපව හැඩගස්වන විට, අපට අපගේම මාර්ගවලින් ක්‍රිස්තුස්වහන්සේගේ ධර්මිෂ්ඨකමට සැබවින්ම ගැලවිය හැකිය. හෙබ්‍රෙව 4:12 හි දේවියන්වහන්සේගේ වචනය ජීවමාන සහ බලවත් බව සහතික කරයි.කොයිම දෙමුහත් කඩුවකටවත් වඩා තියුණුය, ප්‍රාණය හා ආත්මයද සන්ධි හා ඇටමිදුළුද වෙන්කරන තරමට කාවදින්නේය. සියල්ලටම වඩා උතුම් ප්‍රතිලාභය නම් උන්වහන්සේගේ වචනය තුළින් අපට දෙවියන්වහන්සේව වඩාත් හොඳින් දැනගන්නට ලැබීම සහ උන්වහන්සේ සමඟ වඩ වඩාත් සමීප සම්බන්ධතාවයක සිටීමට ලැබීමය.

වචනය සමඟ ඉල්ලා සිටීම

ඔබේ වචන පැහැදිලි වන විට ආලෝකය ලැබේ. එයින් අනුවණයන්ට නුවණ ලැබේ. ගීතාවලිය 119:130
මෙම පදය දෙවියන්වහන්සේගේ වචනය මත මෙනෙහි කරීම තුළින් අවබෝධය සහ හෙළිදරව්ව ලැබෙන බව තහවුරු කරයි. අපි ශුද්ධාත්මයාණන්ට අපගේ මෙනෙහි කිරීම මෙහෙයවන්නට ඉඩ හරිමින් ස්වාමින්වහන්සේ කෙරෙහි බලා සිටින්නේ නම්, දෙවියන්වහන්සේගේ කැමැත්ත අනුව යාච්ඤා කිරීමට අප හොඳින් සූදානම් වනු ඇත.උන්වහන්සේගේ වචනය නැවතත් උන්වහන්සේට යාච්ඤා කිරීම එසේ කිරීමට ස්ථිර ක්‍රමයකි. යෙසායා 55:11 දෙවියන්වහන්සේ මෙසේ කියන බව සහතික කරයි; එලෙස මා මුවින් නික්මෙන වචන මා වෙතම හිස්ව නොපැමිණ මාගේ අදහස් සඵල කර නියමයන් සිකුරටම ඉටුකරයි.
ගැඹුරු අවබෝධයකින් උන්වහන්සේගේ වචනය යාච්ඤා කිරීමෙන් ඉලක්කයට ඊටත් වඩා ළඟා විය හැකිය. ASK Network හි සියළු ක්‍රියාකාරකම් වලදී බයිබලීය ප්‍රතිපත්ති අනුගමනය කරන්නට උත්සාහ දරන නමුත් ඇත්ත වශයෙන්ම යාච්ඤාවන් දෙවියන්වහන්සේ උන්වහන්සේගේ වචනයෙන් කථා කරන දේ මත පදනම් කර ඇත්තේ මේ නිසාය. ගීතාවලිය 29 සාක්ෂි දරන්නේ:
සමිඳුණන්ගේ හඬ බලවත්ය; සමිඳුණන්ගේ හඬ තේජාන්විතය. (4වන පදය)

අන් අයගෙන් ඉගෙනගැනීම

දෙවියන්වහන්සේගේ වචනයේ දැනටමත් සටහන් කර ඇති දේ, සෘජු උපුටා දැක්වීම් හෝ අනුමාන කිරීම් මගින් දෙවියන්වහන්සේට නැවත කථා කිරීමට ශුද්ධ ලියවිලි වචන භාවිතා කළ අයගේ උදාහරණ කිහිපයක් මෙන්න.

- දවිත් ~ 2 සාමුවෙල් 22
- යෝනා ~ යෝනා 2
- පේතෘස් ~ ක්‍රියා 2
- පාවුල් ~ රෝම 9
- යේසුස් ~ මතෙව් 27

ASK Network මෙම පූර්ණ සහ බලවත් ඉතිහාසය තව දුරටත් කරගෙන යන්නට ලැබේවා.

දෙවියන්වහන්සේගේ නාමයන්

ඔබේ නාමයත්, ආඥත් උත්තරීතර බව ඔබ පෙන්වූසේක. ගීතාවලිය 138:2 ආ මෙම පොත් පිංච දෙවියන්වහන්සේගේ වචනය ජීවමාන වචනය බව පෙන්වා දෙන්නට උත්සාහ කර ඇත. හෙබ්‍රෙව් 4:12 එය මෙසේ විස්තර කරයි: දෙවියන්වහන්සේගේ වචනය ජීවමානය; ක්‍රියාශීලීය; දෙමුවහත් කඩුවකටත් වඩා තියුණුය. නමුත් දෙවියන්වහන්සේගේ වචනය මෙනෙහි කිරීම තුළින් දෙවියන්වහන්සේගේ සත්‍යය සොයා යාමේදී, ඉල්ලා සිටීමේදී විශ්වාසවන්ත පිළිතුරු දෙන්නා වන දෙවියන්වහන්සේගේ චරිතය නොසලකා හැරීමට අපි ඉඩනොදෙමු. ශුද්ධ ලියවිල්ලේ මුල් පිටුවල උන්වහන්සේගේ චරිතය හෙළි කිරීමට උන්වහන්සේ භාවිතා කරන නම් මෙන්න, නමුත් බයිබලය පුරාම උන්වහන්සේට බොහෝ නම් සහ විස්තර තිබේ.ඔබේ ඉල්ලා සිටීමේදී ඒවායින් කිසිවක් ප්‍රකාශ කිරීමට පසුබට නොවී, උන්වහන්සේට එලෙසම කතා කරන්න.

יהוה צבאות යෙහෝවා ත්සෙවාඕත් සියලු බලැති දෙවි සමිඳුණන්වහන්සේ 1 සාමුවෙල් 17:45
יהוה עליון යෙහෝවා එලියොන් අති උත්තම හිමිතුමන් ගීතාවලිය 7:17
יהוה רעי යෙහෝවා රෝයි සමිඳුණෝ මා එඬේරාණෝය ගීතාවලිය 23:1
יהוה יראה යෙහෝවා ජීරේ සමිඳුණන් සපයන්නෝය උත්පත්ති 22:14
יהוה נסי යෙහෝවා නිස්සි සමිඳුණන්වහන්සේ මාගේ ධජයය නික්මයාම 17:15
יהוה שלום යෙහෝවා ෂාලොම් සමිඳුණන්වහන්සේ සමාදානය විනිශ්චයකාරයාගේ පොත 6:24
יהוה שמה යෙහෝවා ෂමා සමිඳුණන්වහන්සේ එහිය එසකියෙල් 48:35
יהוה צדקנו යෙහෝවා ත්සිද්කෙනූ සමිඳුණන්වහන්සේ අපේ දැහැමිතාවය යෙරෙමියා 23:6
יהוה מקדשכם යෙහෝවා මෙකඩේෂ්-කෙම් විශුද්ධ කරන සමිඳුණන්වහන්සේ ලෙවි ව්‍යවස්ථාව 20:8
יהוה רפאך යෙහෝවා රෝෆා-චා සුවය දෙන සමිඳුණන්වහන්සේ නික්මයාම 15:26
אלוהים එලෝහිම් දෙවියන්වහන්සේ උත්පත්ති 1:1
אל אלוהי ישראל එල් එලෝහේ ඉශ්‍රායෙල් ඉශ්‍රායෙල්හි දෙවියන්වහන්සේ උත්පත්ති 33:20]
אדני මහෝත්තම දෙවි ස්වාමිනි උත්පත්ති 15:2
אל שדי එල් ශඩායි සියලු බලැති දෙවියන්වහන්සේ උත්පත්ති 17:1
אל עולם එල් ඔලාම් සදතන දෙවි සමිඳුණන්වහන්සේ උත්පත්ති 21:33
אל גיבור එල් ගිබ්බෝර් ප්‍රබල වීර දෙවියන්වහන්සේ යෙසායා 9:6-7
אל עליון එල් එලියොන් පරමෝත්තම දෙවියන්වහන්සේ උත්පත්ති 14:18

දෙවියන් වහන්සේට මහිමය වේ වා! ජේසුස් ක්‍රිස්තුන් වහන්සේ පිළිබඳ පණිවුඩය හා මා දේශනා කළ සුබ අස්න අනුව ද දීර්ඝ යුගයන්හි සැඟවී තිබී දැන් එළිදරව් කොට ඇති අබිරහස අනුව ද ඔබ ඇදහිල්ලෙහි ස්ථිර ලෙස පිහිටුවීමට උන්වහන්සේ පොහොසත් වන සේක. දැන් වනාහි ඒ අබිරහස දිවැසිවරයන්ගේ ලියවිලිවලින් අනාවරණය කර ඇත. සියල්ලන් ම අදහා කීකරු වන පිණිස, සදතන දෙවියන් වහන්සේගේ ආඥවෙන් එය සකල ජාතීන්ට ප්‍රකාශකොට ඇත. සකල ප්‍රඥාවෙන් යුක්ත වූ අසමසම දෙවියන්වහන්සේට ජේසුස් ක්‍රිස්තුන් වහන්සේ කරණකොටගෙන සදහට ම මහිමය වේ වා! ආමෙන්. **රෝම 16:25-27**